31 වන පිටුවෙන් (ටික් ටික් ටික් ටික්)

ඔරලෝසුව... ටික් ටික් හඬ ඔක්කොම හේතුවක් නැතිව එක දිගට හිතට එයිද? යයිද?

හිත එකද... කය දෙකද... කය එකද... හිත දෙකද.... මගේ කය ඇත්තටම ලිහිල්ද...? කේෂාන්තයේ සිට පාදන්තයේ නිය පොත්තටම ඇඟ ලිහිල් කරන්න. මට පරණ උපදෙසක් සිහිවිය. එකල මම එසේ කිරීමට රුචි නොවීමි... එහෙම කළොත් මම මැරයෙිද? මට දැන් මැරෙනවාට වඩා වෙන මොන සැපක්ද? ඒ නිසා මේ බර අත හරින්න ඕන. මම මගේ සිතින් කයේ බර ක්‍රමයෙන් පහ කරන්නට වීමි. හිස, නළල, ඇසිබැම, නාසය, කම්මුල්, නිකට, බෙල්ල, දෙඅත්, පපුව, බඩ, කළවා, දෙදණ, කෙණ්ඩා. විළුඹ, පා ඇඟිළි, යටිපතුළ ඔස්සේ සිතින් අල්ලාගෙන සිටි බර මම ක්‍රමක්‍රමයෙන් නිදහස් කළෙමි. කොපුවකින් කඩුවක් එළියට ගත්තාක් මෙන් මගේ සිරුරෙන් සිත ඉවතට ආවා සේය. මම සීලිම දෙසට පියඹා ගියෙමි. ආපසු හැරී මා දෙසම බැලුවෙමි. හාන්සි පුටුවේ මා උඩුබැලි අතට වාඩි වී කට බලියාගෙන සිටියි. මට මා ගැන අති මහත් දුකක් ඇති විය... පවු අප්පා.... අසරණයා.... හොඳටම වයසට ගිහින්... කොහොම හිටිය කොල්ලෙක්ද...? ආපසු කඩුව කොපුවට වැටුණේය.... මගේ සිරුර මොහොතකට ගැස්සී ගියේය....

සිත එකද... කය දෙකද... කය එකද... සිත දෙකද...
සිත කයද... කය සිතද... සිත එකක්ද... කය තව එකක්ද
ඔව් සිත එකක්..... කය තව එකක්... දෙකකුත් නොවෙයි... එකකුත් නෙවෙයි... එකකුත් නෙවෙයි... දෙකකුත් නොවෙයි.

මම "යුරේකා" කියා කෑ ගැසුවෙමි. එහෙත් හඬ පිට නොවිණ.

මට උදෑසන සාත්තු සේවිකාව මගේ සිරුර රෙදි කඩකින් පිරි පිරිමදිනවා මතක් විය. මම මගේ සිතින් ම'සිතැඟි පරිදි මගේ මුලු කයම පිරිමැද්දෙමි. උදෑසන සාත්තු සේවිකාව මගේ ඇඟ පිස දමූ රෙදිකඩ පසෙකට අල්ලා දැතින්ම එම රෙදි කඩම ඇපිල්ලූ ආකාරය සිහිවිය. මම මගේ සිතින් මගේ සිතම පිරිමැද්දෙමි. එහි බලන බලන සැම තැනම දමා තිබුණේ අණ්ඩය. කොටින්ම අණ්ඩ ගොඩක් මිස රෙදි කඩක සේයාවක්වත් මට නොපෙණින. මේ අණ්ඩ ගොඩත් ගළවා දැමීමට මට උවමනා විය... !

මට නැවතත් සීලිම දෙසට පියාඹා යාමට අවශ්‍ය විය. එහෙත් මෙවර එය පෙර සේ පහසු නොවීය. රිලැක්ස්...... මම නැවත මූලික කරුණ දෙසට හැරුනෙමි. කේෂාන්තයේ සිට පාදන්තයේ නිය පොත්තටම ඇඟ ලිහිල් කරන්න.

..... දැන් මම සීලිමද පසුකර අහසේ පියඹා යමි. ඒ අතර රෙදි කඩ පිරිමැද්දෙමි. පෙර මට සිරුර බරක් විය. සිතද බරක් විය. දැන් මා සැහැල්ලුය. ඒ කයේ බර පහවීම නිසා සිතට ලද විවේකයකි. මෙච්චර සැපක්.....!!

හදිසියේම ගුවන් යානයක් වායු රික්ත මත වැටී වැටී ගමන් කරන විට මෙන් ම'සිත ගැස්සිණ. මම මේ සැපයට ලොල් වීමි. මේ සැප නැති වෙතැයි සිතෙන විට මා වායු රික්තයේ පහළට.....පහළට..... කඩා වැටී.....වැටී..... ගමන් කරනවාක් මෙන් විය. දැන් මට හාන්සි පුටුවේ උඩුබැල්ලෙන් කට බලියාගෙන සිටින මා ගැන එතරම්ම හැඟීමක් නැත... හැඟීමක් ඇත්තේ වායු රික්ත වල නොවැටෙන්නටය. හිතකට හිතක් මේ තරම් බරට සහ රළුවට දැනේ යැයි මා කෙදිනකවත් සිතා නොතිබුණි. හිතින් අල්ලාගෙන සිටි කයට වඩා තදින් මා මගේ සිතින් මගේ සිතම අල්ලාගෙන සිටින වග ඉතා සියුම්ව මට දැනුණි.

සිත මගේද... මගේ සිතද... සිත මගේද.... මගේ සිතද.... අණ්ඩ දැමූ රෙද්ද මා ඉදිරියේ පෙනෙන්නට විය... මම අණ්ඩ එකින් එක ගළවා දැමුවෙමි. අවසානයේ රෙදි කඩ නොපෙනී ගියේය... සිතද නොපෙනී ගියේය... ඒ සමඟ මාද අන්තර්ධාන විය...මොහොතකට අන්ධකාරය තුළැම ඉමහත් අලෝකධාරාවක් ඇතිවිය....

"නාඩි වැටෙනවද බලන්න..." මගේ දකුණු අත සෙමෙන් ඉහළට එසවෙනු මට දැනුණි. "නාඩි වැටෙන්නේ හරිම හෙමින්" යැයි පවසනවා මට ඇසුනි.

"බැන්ඩරා නැගිටින්න... නැගිටින්න... දැන් කෑම වෙලාව....." මගේ උරහිස පැද්දී ගියේය. නිකට දෙපසට පහරවල් කිහිපයක් වැදුනාද මතකය. "දැන් හරි" එක් සාත්තු සේවිකාවක සුසුමක් හෙළමින් කීවාය.

එවර මගේ උරහිස වටා දැමූ ඒප්‍රනය පෝරකයට ඇදගෙන යනවාක් මෙන් හැඟීමක් ම'සිතෙහි ජනිත කළේය. විටෙක කෑම පිරිය. විටක මතක් කිරීමට බැරි තරම් අප්‍රියය. ඒත් කාට කියන්නද? කෙසේ කියන්නද? මාත් මනුස්සයෙක්. මේවා මොවුනට කෙසේ පහදා දෙන්නද? මෙවුන් යාන්ත්‍රිකය. අප අසරණය.

මම දිවා ආහාරය ප්‍රතික්ෂේප කළෙමි. බෙහෙත් පෙති ගැනීමටද සිතක් ඇති නොවුණෙන් ඒවාද ප්‍රතික්ෂේප කළෙමි. ආයේ කෙදිනකවත් කවුළු තිරය පැන එන උදා ළාහිරු එළිය දැක ගැනීමට අවශ්‍යතාවක් හෝ රුචියක් සිතේ කවර කොණකවත් නොමැති බවද ඒ අතරම මට වැටහී තිබිණ.

## Array of Events from Sri Lankan Agros & Veterinarians

It was an organization sprouted 12 years back with a handful of members to strengthen the brotherhood and foster the fellow beings in their field of expertise, which has now grown up to a massive tree with more than 200 members in Sri Lankan Agricultural and Veterinarians Association.

Annual General Meeting of Association is planned to be held on 5th September at 7.00pm at No 06. Mount Street, Mount Neighbourhood House, Glen Waverley (Melway 71 C3) to appoint new office bearers and to table the programme for 2009/10.

The annual family get-together and fellowship dinner of the Association will be held on 26th September from 6.30pm at Ajani Centre, 284, Thompsons Rd, Lower Templestowe (Melway 32 K 7). Organizing committee invites members and new comers who wish to be members to participate in these grand events. Crowd will be entertained by 'See7th', and special Dosai menu will be available for the first time in Melbourne at a dinner dance.

### Sri Lankan Plants & Herbs Project

Association received an overwhelming response from the community for the project initiated to promote Sri Lankan plants and herbs for sustainable home gardening among Melbournians. Association planned to expand the project by organizing a plant stall to sell or exchange plants such as Karapincha (Curry Leaves), Gotukola (Arthritis Plant), Mukunuwenna and Saman Pichcha(Sri Lankan Jasmine) on 26th September at Ajani Centre between 6.30 pm to 8.00 pm. General public is invited to buy / exchange plants or discuss experiences in home gardening with the organizers. **Please contact Vimukthi 0433030382 , Nilantha 0433277274 or Chinthana 0430013990** for further details.

## SCATS කෙටි නාට්‍ය උළෙල 2009

SCATS සංවිධානය මගින් දෙවසරකට වරක් ඉතා සාර්ථකව මෙහෙයවන කෙටි නාට්‍ය උළෙල තෙවන වරටත් මේ වසරේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙල්බන්හි ශ්‍රී ලාංකික ජන සමාජයේ වසන කලා රසිකයන්ගේ රසඥතාව වැඩි දියුණු කිරීමට හා නාට්‍යකරණයේ විවිධ ශිල්පීය දක්ෂතා ප්‍රගුණ කිරීමටත් අවස්ථාවක් සැළසීම මේ උළෙලේ අරමුණයි.

සංවිධායකයින්ගේ අරමුණු සඵල කරමින් මෙතෙක් පැවැත්වූ නාට්‍ය උළෙල තුළින් මතුවූ නාට්‍ය ශිල්පීන් අතරින් ඉතා දක්ෂ රංගන ශිල්පීන් සහ නාට්‍ය අධ්‍යක්ෂවරුන් බිහි වී සිටිනු දැකීම සතුටට කරුණකි.

මෙවර නාට්‍ය උළෙල 2009 සැප්තැම්බර් 27 වන ඉරිදා පව 530 ට කිව් උසස් පාසලේ රොන්සෝන්ස් රඟහලේදී පැවැත්වෙයි.

අපේ සහෝදර ශිල්පීන්ගේ සහජ දක්ෂතා එළිදක්වන මේ අවස්ථාවට සහභාගි වී ඔවුන් දිරිගන්වන මෙන් ඔබටද ඇරයුම් කෙරෙයි.

## SCATS VCE SEMINAR

A seminar for VCE students sitting for VCE 2009 , conducted by reputed teachers has been organised by SCATS. The details are as follows:-
Dates : 3rd and 4th October 2009-
Venue: Rotunda building, Monash University, Clayton Campus.
Time ; Two sessions each day, morning and afternoon.
Subjects and the teachers who will conduct the seminar:-
i). Maths - Ms Nalini Devendra of Sacred Heart Girls College, Oakley
ii). English – Ms Pam Feldman, experienced VCE teacher , currently teaching in a private school and is reading for a PhD in Education .
iii). Chemistry – Ms Ramani Perera of St John's College, Preston.
iv). Physics – Mr Athil Gunasekara, of Aliya College Hawthorn.

Prior registration is required.

For further details, please contact:
. Mr Sunil Pushpasiri – 0425 829 100
Dr Senake Perera – 9801 4356

